## සාරාංශය

### 1. ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශය.

සංවර්ධිත රටවල අත්දැකීම් ඔස්සේ යමින් මීට දශක දෙක තුනකට පෙර අනුගමනය කරන ලද උපායමාර්ග නව සංවර්ධන අවශ්‍යතා සමග නො ගැලපෙන බව තුන්වැනි ලෝකයේ රටවල් විසින් අවබෝධ කොටගෙන තිබේ. එසේම, විකල්පයක් වශයෙන් එම රටවල සංවර්ධන අවධානය ග්‍රාමීය පථය වෙත යොමු වී තිබේ. ග්‍රාමීය සංවර්ධනය හා එහි අරමුණු ද, එම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ගන්නා ලද උපායමාර්ග හා ප්‍රවේශයන්ද දෙස බලන විට අප අවධානයට යොමු වන 'උඩරට ගැමි පුනරුත්ථාපන වැඩපිළිවෙල' ඉලක්ක ජන කණ්ඩායමක සංවර්ධනය සඳහා යොමු කරන ලද, ඒකාබද්ධ ප්‍රවේශයකින් හා ප්‍රාදේශීය මානයකින් යුක්ත වූ 'පුරෝගාමී ග්‍රාමීය සංවර්ධන ප්‍රයත්නයක්' බැව් පෙනී යයි. ඒ අනුව, මෙම වැඩපිළිවෙල මගින් [illegible] වශයෙන් සලකන ලද ප්‍රදේශයක සංවර්ධනය සඳහා ග්‍රාමීය සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් විශේෂ වැදගත්කමකින් යුක්ත ප්‍රවේශයක් අනුගමනය කොට තිබේ. මෙම ප්‍රවේශයෙහි අඩංගු මූලික ලක්ෂණ හඳුනාගැනීම සඳහා අප අධ්‍යයනය යොමු කෙරිණි. ඒ තුළින් ග්‍රාමීය සංවර්ධනය දිරිගැන්වීම සඳහා මෙම වැඩපිළිවෙලින් ලත් අත්දැකීම් මගින් ප්‍රමාණවත් පදනමක් සැපයෙන්නේ ද යන්න හඳුනාගැනීමට වෑයම් කරන ලදි.

### 2. උඩරට ගැමි ජන සමාජයේ සමාජ-ආර්ථික පසුගාමීත්වය.

'උඩරට ගැමි ගොවි අංශය' යන යෙදුමෙන්, එක් අතකින්, ප්‍රාදේශීය ජනවාර්ගික හා සමාජයීය වශයෙන් විශේෂිත ගතිලක්ෂණ වලින් යුක්ත වූද, අනෙක් අතට, වෙනත් ජන කණ්ඩායම්, විශේෂයෙන් ම, පහත රට සිංහලයින් සහ ශ්‍රී ලාංකික ද්‍රවිඩයින් සමග සසඳන විට බොහෝ දුරට සමාජ-ආර්ථික වශයෙන්

පසුගාමීත්වයකින් යුක්ත වූ ද ජන කණ්ඩායමක් හැඳින්වෙයි. මෙහි කාර්මික පදනම් හඳුනාගත යුත්තේ යටත් විජිත පාලන අත්දැකීම් ආශ්‍රයෙනි. යටත් විජිත පාලන සමය තුළ මෙරට සිදු වූ පරිවර්තනීය ක්‍රියාවලිය මෙම පසුගාමීත්වය කෙරෙහි බලපෑවේ මිශ්‍ර ද්විත්ව ආකාරයෙනි.

උඩරට වැවිලි කර්මාන්තය දියුණු වෙමින් පැවැති අවධියේ පහතරට ප්‍රදේශ එක්වරම පුළුල් වශයෙන් ආර්ථික පද්ධතියට අවශෝෂණය වෙමින් පැවැතියේ ය. එහි, පාරම්පරික ගොවි තත්‍ව බිඳ වැටුන ද, ඒ වෙනුවට වැටුප් ශ්‍රමය හඳුන්වා දෙනු ලැබූ අතර විකල්ප රැකියා විවිධ බිම් වෙමින් පැවතිනි. පැරණි පන්සල් අධ්‍යාපන ක්‍රමය වෙනුවට මිෂනාරි අධ්‍යාපනය දියුණු වෙමින් පැවතිනි. නව සිහි-රිති පද්ධතීන් හඳුන්වා දෙනු ලැබ තිබිනි. මුද්‍රණ පරිහරණය, මාධ්‍යපරිහරණය තුළින් තරඟකාරිත්වය වැඩි වෙමින් පැවතිනි. ජනයාගේ සාරධර්ම නව පරිවර්තනයට අනුව හැඩගැසෙමින් පැවතිනි. එහෙත්, සමකාලීන උඩරට ප්‍රදේශයන්හි එවැනි පරිවර්තනයක් සිදු නොවී ය. [illegible] උඩරට ක්‍රමය යොදාගත නො හැකි විනි. පන්සල් අධ්‍යාපන ක්‍රමය බිඳ වැටුන ද එය නැවත ගොඩනැංවීමක් සිදු නොවී ය. ප්‍රදේශයේ වර්ධනය වෙමින් පැවති ආර්ථික අවස්ථා බොහොමයක් ලබාගන්නා ලද්දේ බටහිරකරණයට ලක්වී සිටි පහතරට සිංහලයින් සහ ශ්‍රී ලාංකික ද්‍රවිඩයින් විසිනි. පැරණි කුල සංස්ථා බිඳ වැටීමෙන් පසු පහත රට සමහර කුලයන්හි නැගීමක් සිදු වුව ද පහතරට එවැන්නක් සිදු නොවී ය. උඩරට ජන සමාජයේ සමාජ-ආර්ථික පසුගාමීත්වයට සම්බන්ධ හේතු බොහොමයක් මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ ය.

## 3. උඩරට ගැමි පුනරුත්ථාපන වැඩපිළිවෙල.

උඩරට ගැමි පුනරුත්ථාපන වැඩපිළිවෙල උඩරට ගැමි ජන සමාජයේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා රාජ්‍ය අංශයෙන් ගන්නා ලද නිල සංවර්ධන ප්‍රයත්නයකි.

නිදහස ලැබීමත් සමග ම 'උඩරට ගැමි කොමිසන් සභාව' පත් කරන ලද්දේ, උඩරට ගැමි ජන සමාජයේ සමාජ-ආර්ථික ගැටළුවලට පිළියම් යෙදීම සඳහා රාජ්‍ය අංශයෙන් විශේෂ පරිශ්‍රමයක් දැරිය යුතුය යන ආකල්පය ඇතිව ය. උක්ත කොමිසමේ යෝජනා ක්‍රියාත්මක වැඩපිළිවෙලක් බවට පත් කිරීමේ දී පළමුව, ගැමි අංශයේ සංවර්ධනය සඳහා ම යොමු කරන ලද ස්ථාවර ආයතනයක් පිහිටුවනු ලදී. දෙවනු ව, ඒ වන විට පැවැති රාජ්‍ය ආයතන හා දෙපාර්තමේන්තු පද්ධතියට අමතර ව සංවර්ධන කටයුතු මෙහෙයවීම සඳහා මූලය ප්‍රතිපාදන සපයන ලදී. තෘතීයාත්මක ව මෙම ආයතනයට පැවරී තිබුණේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඒකාබද්ධ කිරීම සහ මෙහෙයවීම ය. බිහි කරන ලද නව ආයතනයෙන් ඒ ඒ දෙපාර්තමේන්තු හා ආයතන අතර හොඳ සම්බන්ධීකරණයක් ඇතිවීමේ අඩුව පිරිමැසීමට උත්සාහ දරණ ලදී.

කෙසේ වුවද, මෙම වැඩපිළිවෙල ආරම්භ කරන ලද මුල් අවධියේ උඩරට ප්‍රදේශ සංවර්ධනය සඳහා විශේෂ සංවිධාන ප්‍රයත්නයක් දැරීමේ අවශ්‍යතාව පිළිබඳ මතක් වූ උද්යෝගයක් හා දේශපාලන ප්‍රතිපත්තියක් දක්නට ලැබුණ ද, පසු කල, ඒ පිළිබඳ ව දක්වන ලද අවධානය අඩු වී ගියේ ය. අවසානයේ දී උඩරට ගැමි පුනරුත්ථාපන වැඩපිළිවෙල විශාල පරිමාණයෙන් ඇරඹී ක්‍රමයෙන් අභාව වී ගිය ආයතනයක් බවට පත් විය.

4. අත්දැකීම්.

- පසුගිය දශක දෙකහමාරක පමණ කාලය තුළ මෙම වැඩපිළිවෙල ක්‍රියාකාරී ව ඇත්තේ, සංවර්ධනයේ අඩුතැන් පිරවීමේ කාර්යාංශයක් වශයෙනි. එක් අතකින් පරියන්තයේ පිහිටි රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු ආදිය මගින් එදිනෙදා කෙරෙන කටයුතුවල අඩුතැන් පිරවීම සඳහා යොදාගනී. අනෙක් අතට, සංවර්ධන අවධානයෙන් බොහෝ දුරට බැහැර වූ 'පසුගාමී' ප්‍රදේශ කෙරෙහි වැඩි අවධානයක් මෙමගින් යොමු කිරීමට හැකි වේ යැයි අදහස් කරන ලදී.

- අවිදියුණු ප්‍රදේශයක ඉලක්ක ජන කණ්ඩායම්වල ජීවන තත්ත්වය නංවාලීමේ ප්‍රයත්නයක් වශයෙන් උ.ගැ.ප්‍ර.කො. විසින් අනුගමනය කර ඇත්තේ මූලික අවශ්‍යතා සම්පාදන ප්‍රවේශයයි. නිෂ්පාදන අංශ දියුණු කිරීමෙන් ජීවන තත්ත්වය ඉහළට ගෙන ඒමට වඩා, සෑප්පු ම් ගෙවින එරිකල විදුලි පහසුකම් සංවර්ධනය කිරීමට නැඹුරු කොට තිබේ. කොමිසමට අයත් බල ප්‍රදේශය විශාල ය. එහෙත් සංවර්ධන කටයුතු ගෙනයාම සඳහා ලැබෙන සම්පත් ප්‍රමාණය කුඩා ය. ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙලක් වශයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය තාක්ෂණික සම්පත් හෝ හැකියාවක් ඊට නැත. මේ වැනි පාලනයකට ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විශාල බලපෑමක් කළහැකිද යන ප්‍රශ්නය මෙහිදී මතු කළ හැකි ය.

- සිසියම් සංවර්ධන කාර්යයන් කරගෙන යාම හෝ අත හැර දැමීම සංවර්ධනයට අදාල කරුණු මත නො ව, වෙනත් බලපෑම් අනුව තීරණය වේ. දේශපාලනමය වශයෙන් කෙරෙන මෙහෙයවීම්වලින් යුක්ත සංවර්ධන කාර්යයන් යොමු වීම කොමිසමේ සාමාන්‍ය පිළිවෙතයි. කටයුතු කාලසීය පිළිබඳ ක්‍රමවත් සැලැස්මක් ඊට නැත. ක්‍රමවත් බවකින් තොර ව, පුළුල් අවකාශීය පැතිරීමකින් යුක්ත ප්‍රදේශයකට යටිතල ව්‍යුහ පහසුකම් ලබාදීමේ කොමිසම් සතු මෙම ක්‍රියා පරිපාටිය ප්‍රාදේශීය සංවර්ධන වැඩපිළිවෙලක් වශයෙන් එය කෙරෙහි තැබිය හැකි බලාපොරොත්තු සැලකිය යුතු තරමකින් හීන කොට තිබේ.

- පසුගාමී ප්‍රදේශ කෙරෙහි සංවර්ධන අවධානයක් යොමු කිරීම පසෙක තිබියදී වඩාත් දියුණු, ජන සංඛ්‍යාව අධික ප්‍රදේශ කෙරෙහි මුදල් සම්පත් යොමු කොට තිබේ. සංවර්ධන යෝජනා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මගින් ඡන්ද කොට්ඨාශ මට්ටමින් ලැබෙන විට එවැන්නක් සිදුවීම වැලැක්විය නො හැකි ය. ශ්‍රී ලංකාව වැනි රටවල නොදියුණු ප්‍රදේශ සංවර්ධනය අරමුණු කොටගත් වැඩපිළිවෙලක්, ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා වලට මුහුණපාන බව මෙයින් ලද හැකි අත්දැකීමයි.